ශ්‍රී ලංකා ගුවන් හමුදා මූලස්ථානය, තැ.පෙ. 594, ආරක්ෂක මූලස්ථාන සංකීර්ණය, ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ, ශ්‍රී ලංකාව.
இலங்கை விமானப்படைத் தலைமயகம், த. பெ. 594, பாதுகாப்பு தலைமயக கட்டிடம், ஸ்ரீ ஜயவர்தனபுர கோட்டே, இலங்கை.
SRI LANKA AIR FORCE HEADQUARTERS, P.O. Box 594, Defence Headquarters Complex, Sri Jayewardenepura Kotte, Sri Lanka.

දුරකථනය/ தொலைபேசி / Telephone – පොදු/ பொது/ General 2441044/2495495; සෘජු/ நேரடி/ Direct; දිගුව/ இணைப்பு/ Extension
ෆැක්ස්/ பக்ஸ்/Fax – පොදු/ பொது/ General 2441044/2495495; සෘජු/ நேரடி/ Direct; දිගුව/ இணைப்பு/ Extension
ඊ මේල්/ மின்அஞ்சல்/ e-mail: slaf.media@gmail.lk
වෙබ් අඩවිය /இணையதளம்/ Website: www.airforce.lk

2024 ඔක්තෝම්බර් මස 24 වන දින

**<u>බීච් ක්‍රාෆ්ට් කින්ග් එයාර් 350 වර්ගයේ නව නිරීක්ෂණ ගුවන් යානාවක් ශ්‍රී ලංකා ගුවන් හමුදාවට එක්වෙයි</u>**

1. ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ ගුවන් ශක්තිය ඉහල නැංවීමේ අරමුණින් සිදුකරගෙන යනු ලබන වැඩ පිළිවෙලෙහි තවත් සුවිශේෂී අවස්ථාවක් ලෙස ඕස්ට්‍රේලියානු රාජකීය ගුවන් හමුදාව විසින් භාවිතා කරන ලද බීච් ක්‍රාෆ්ට් කින්ග් එයාර් 350 (Beechcraft King Air 350) වර්ගයේ නිරීක්ෂණ ගුවන් යානයක් 2024 ඔක්තෝම්බර් මස 24 වන දින ශ්‍රී ලංකා ගුවන් හමුදා ගුවන් යානා සංචිතයට එක්වන අතර එය ඉදිරියේදී ගුවන් හමුදා අංක 03 සමුද්‍රීය බලසෙණයට (No. 03 Maritime Squadron) අනුයුක්තව රාජකාරි ඇරඹීමට නියමිතව ඇත.

2. ශ්‍රී ලංකාව සහ ඕස්ට්‍රේලියා රජය සමග තිබෙන සමීප සහයෝගීතාවයේ සහ හවුල්කාරීත්වයේ ශක්තිමත්භාවය විදහා දක්වමින්, ශ්‍රී ලංකාවට අයත් මුහුදු කලාපයේ සමුද්‍රීය ආවේක්ෂණ හැකියාව වර්ධනය කිරීම සඳහා, මෙම Beechcraft King Air 350 වර්ගයේ සමුද්‍රීය ආවේක්ෂණ කටයුතු සඳහා යොදාගනු ලබන නිරීක්ෂණ ගුවන් යානය ඕස්ට්‍රේලියානු රජයේ ප්‍රධානයක් ලෙස හිමිවේ. එමගින් කලාපය තුල සිදුකරනු ලබන සොයාගැනීම් සහ මුදවාගැනීම්, අන්තර්ජාතික මට්ටමෙන් සිදුකරනු ලබන අපරාධ සහ මිනිස් ජාවාරම් තුරන් කිරීමට ආරක්ෂිතව හා සහයෝගීතාවයෙන් කටයුතු කිරීමට අවස්ථාව සැලසේ.

3. ශ්‍රී ලංකාවේ ගුවන් සීමාව (Flight Information Region - FIR) හා සුවිශේෂී ආර්ථික කලාපය (Exclusive Economic Zone - EEZ) තුල මෙම බීච් කින්ග් එයාර් 350 ගුවන් යානය ඵලදායී ලෙස යොදාගනිමින් සමුද්‍රීය වසන් දැනුවත් කිරීමේ (Maritime Domain Awareness - MDA) විෂයට අදාල රාජකාරීන් තව දුරටත් පුළුල් කිරීම මෙමගින් සිදු කරනු ලබයි. තවද, ඉන්දියානු සාගර කලාපය ආශ්‍රිතව සිදුවෙමින් පවතින සමුද්‍රීය මිනිස් ජාවාරම අද වන විට ජාත්‍යන්තර මට්ටමේ ප්‍රශ්නයක් වී ඇති අතර ඒ සඳහා කලාපීය රටවල්වල සහයෝගීතාවය, අන්තර්ජාතික මට්ටමෙන් සිදුකරනු ලබන මිනිස් ජාවාරම් මුලින් උපුටා දැමීමේ ක්‍රියාමාර්ග සාක්ශාත් කර ගැනීමට මහඟු පිටුවහලක් වේ.

ගෲප් කැප්ටන් එරන්ද ගීගනගේ
මාධ්‍ය අධ්‍යක්ෂ
ගුවන් හමුදා මාධ්‍ය ඒකකය